# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2421/30 - 2025 ජනවාරි මස 31 වැනි සිකුරාදා - 2025.01.31

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2003 අංක 25 දරන මුදල් පනත**

2(1) වැනි වගන්තිය යටතේ නියෝගය

2003 අංක 25 දරන මුදල් පනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මා වෙත පවරා ඇති බලතල ප්‍රකාරව, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය අනුර කුමාර දිසානායක වන මම, මෙම නියෝගය මඟින් 2024 පෙබරවාරි මස 01 දිනැති අංක 2369/27 දරන *අති විශෙෂ ගැසට්* නිවේදනය, 2023 ජූලි මස 25 දිනැති අංක 2342/24 දරන *අති විශෙෂ ගැසට්* නිවේදනය සහ 2023 අප්‍රේල් මස 25 දිනැති අංක 2329/19 දරන *අති විශෙෂ ගැසට්* නිවේදනය මඟින් සංශෝධිත පරිදි 2023 ජනවාරි මස 11 දිනැති අංක 2314/16 දරන *අති විශෙෂ ගැසට්* නිවේදනය මඟින් ප්‍රකාශයට පත්කරන ලද නියෝගය, එහි I වන උපලේඛනයෙහි අංක i, ii සහ iii යන අයිතම වෙනුවට පහත උපලේඛනයෙහි අයිතම ආදේශ කිරීම මඟින් 2025 ජනවාරි මස 31 දින සිට ක්‍රියාත්මක වන පරිදි සංශෝධනය කරමි.

**අනුර කුමාර දිසානායක,**
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය.

2025 ජනවාරි මස 31 වැනි දින,
කොළඹ 01,
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ දී ය.

1A - PG 7015 — 404 (2025/01)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**උපලේඛනය**

| *I තීරුව* | | | *II තීරුව* |
|---|---|---|---|
| i. | මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපළ සිට ගුවන් යානයකින් ශ්‍රී ලංකාවෙන් පිටත්ව යන සෑම තැනැත්තෙක්ම | ජාත්‍යන්තර ගුවන් සමාගමක් විසින් මෙහෙයුම් ආරම්භ කරනු ලබන දින සිට වසර තුනක් සම්පූර්ණ වන දින හෝ 2025 දෙසැම්බර් මස 28 දින යන දෙකෙන් පළමුව එළඹෙන දිනය දක්වා | නිදහස් |
| ii. | කොළඹ ජාත්‍යන්තර ගුවන් තොටුපළ, රත්මලාන සිට ගුවන් යානයකින් ශ්‍රී ලංකාවෙන් පිටත්ව යන සෑම තැනැත්තෙක්ම | 2025.03.27 සිට 2026.03.26 දක්වා | ඇ.ඩො.<br>30.00 |
| iii. | යාපනය ජාත්‍යන්තර ගුවන් තොටුපළ සිට ගුවන් යානයකින් ශ්‍රී ලංකාවෙන් පිටත්ව යන සෑම තැනැත්තෙක්ම | 2025.02.01 සිට 2026.01.31 දක්වා | ඇ.ඩො.<br>30.00 |

EOG 01 - 0324

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.